# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**10 ශ්‍රේණිය** | **ඉතිහාසය - I**

නම/ විභාග අංකයः ........................................ කාලය පැය 1යි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරා ඔබට දී ඇති පිළිතුරු ලකුණු කිරීමෙ පත්‍රය තුළ X ලකුණු කරන්න.**

01) අතීත ප්‍රජාව විසින් විවිධ කාල වකවානුවලදී ලියන ලද ග්‍රන්ථ හෝ ලේඛන හඳුන්වනු ලබන්නේ
1) ඓතිහාසික ග්‍රන්ථ නමින් ය.
2) සංදේශ කාව්‍ය නමින් ය.
3) පුරා විද්‍යාත්මක මූලාශ්‍රය නමින් ය.
4) සාහිත්‍ය මූලාශ්‍රය නමින් ය.

02) ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැදෑරීමේ දී වඩාත් ප්‍රයෝජනවත් වන කෘතිය මින් කුමක්ද?
1) රාජාවලිය
2) නිකාය සංග්‍රහය
3) බෝධි වංසය
4) සද්ධර්මාලංකාරය

03) ශ්‍රී ලංකාවේ භාවිතා වූ පැරණිතම කාසි වර්ගය වන්නේ මින් කුමක්ද?
1) ගජ ලක්ෂ්මී
2) මස්ස
3) පුරාණ
4) ඇතා හා ස්වස්තිකය

04) සිරකරුවෙකු ලෙස සිටියදී ලද අත්දැකීම් පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ එවක පැවති සමාජය පිළිබඳ කෘතියක් රචනා කරන ලද්දේ
1) රොබට් නොක්ස්
2) රිබෙයිරෝය
3) මෙගස්තනීස්
4) ඉබන් බතුතා

05) අනුරාධපුර යුගයේ මුල් කාලීන ශිලා ලිපිවල භාවිතා කර ඇති අක්ෂර හඳුන්වන්නේ මින් කවර නමකින්ද?
1) බ්‍රාහ්මී
2) පාලි
3) සංස්කෘත
4) ප්‍රාකෘත

06) වෙනත් පුද්ගලයින් විසින් පවසන ලද තොරතුරු මත ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා ලියූ කතුවරයා මින් කවුද?
1) පිලිප්පස් බැල්ඩියස්
2) රිබෙයිරෝ
3) ෆර්නාඕ ඩීක්වේරෝස්
4) රොබට් නොක්ස්

07) මිනිහාගල්කන්ද, බුන්දල, පතිරාජවෙල යන ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන අයත් වන්නේ මින් කුමන වර්ගීකරණයකටද?
1) වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන
2) පහතරට වියළි කලාපීය ලෙන්
3) කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන
4) පහතරට තෙත් කලාපීය ලෙන්

08)දකුණු ආසියානු කලාපය කෘෂිකර්මාන්තයට උචිත ලෙස දේශගුණ විපර්යාසයකට ලක් වූ අවධිය මින් කුමක්ද?

1) ප්ලයිස්ටොසීන යුගය
2) හොලෝසීන යුගය
3) මෙගලිතික යුගය
4) මුල් ඓතිහාසික යුගය

09)ගල් මෙවලම් වෙනුවට යකඩ ලෝහය භාවිතා කරමින් මෙවලම් නිෂ්පාදනය ආරම්භ වූයේ කුමන යුගයේ ද?

1) පූර්ව ඓතිහාසික යුගය
2) මුල් ඓතිහාසික යුගය
3) ප්‍රාග් ඓතිහාසික යුගය
4) ඓතිහාසික යුගය

10)සකපෝරුව භාවිතා කරමින් සකස් කරන ලද වළඳක කොටසක් හමුවී ඇති ස්ථානය කුමක්ද?

1) හල්දුම්මුල්ල
2) වැල්ලෙ ගංගොඩ
3) පාහියන්ගල
4) හෝර්ටන්තැන්න

11)ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන අතුරින් බෙල්ලන් බැඳි පැලැස්ස සම්බන්ධයෙන් නිවැරදි වගන්තිය වන්නේ මින් කුමක්ද?

1) පහතරට වියළි කලාපීය ලෙනකි
2) තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයකි
3) පහතරට තෙත් කලාපීය ලෙනකි
4) කඳුකර එළිමහන් දඩයම් වාසස්ථානයකි

12)ඉතා ඈත අතීතයේ දී පවා කාන්තාවන් තම රූ සපුව අලංකාර කරගැනීමට මහත් උනන්දුවක් දක්වූ බවට තොරතුරු හමුවන ස්ථානයක් වන්නේ

1) කුරුවිට බටදොඹලෙන
2) උඩරංචාමඩම
3) හල්දුම්මුල්ල
4) බෙරගල

13)අනුරාධපුරය නගරය නම් කිරීමට "නුරුපුර" යන ව්‍යවහාරය භාවිතා කළ බවට තොරතුරු හමු වූ පුරා විද්‍යාත්මක මූලාශ්‍රය මින් කුමක්ද?

1) බුද්ධන්නෙහෙල සෙල්ලිපිය
2) වල්ලිපුරම් රන් සන්නස
3) පනාකඩුව තඹ සන්නස
4) කොත්ගල්කන්ද සෙල්ලිපිය

14)පරුමකවරුන්ගේ සහාය ලබාගෙන විමධ්‍යගතව පැවති දේශපාලන බලය විමධ්‍යගත කළ රජතුමා කවුද?

1) දේවානම්පියතිස්ස රජු
2) පණ්ඩුකාභය රජු
3) වසභ රජු
4) දුටුගැමුණු රජු

15)වැව් පද්ධතියක් සහ ඊට අයත් ගම් කිහිපයක ජීවත් වූ වැසියන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් තීරණ ගැනීමට බලයක් පැවරී තිබුණේ

1) පරුමකවරුන්ට
2) සේනාපතිවරුන්ට
3) දසගම් ඇත්තන්ට
4) ගමිකවරුන්ට

16)අතීතයේ ගම් නායකයින් සුභදශීලීව කටයුතුකළ බවට තොරතුරු සපයන සෙල්ලිපියක් වන්නේ

1) කොත්ගල්කන්ද සෙල්ලිපිය
2) යටහලෙන සෙල්ලිපිය
3) කොරවක්ගල සෙල්ලිපිය
4) සිතුල්පව්ව සෙල්ලිපිය

17)අන්තර් කලාපීය අවශ්‍යතා උදෙසා දේශීය කටයුතු මෙහෙය වූ නායකයෙකු වශයෙන් වැදගත් රජු වන්නේ මින් කවුද?

1) වසභ රජු
2) මහසෙන් රජු
3) I වන කාශ්‍යප රජු
4) I වන පරාක්‍රමබාහු රජු

18)පහත දැක්වෙන "අ" සහ "ආ" තීරු නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. I වන ගජබාහු රජතුමා | A- චීනය සමග සම්බන්ධතා පැවැත්වීම |
| 2. I වන විජයබාහු රජතුමා | B- රෝමය සමග සම්බන්ධතා පැවැත්වීම |
| 3. භාතිකාභය රජතුමා | C- ඥාති සබඳතා මත දේශපාලන බලය ස්ථාවර කර ගැනීම |
| 4. VI වන අග්ගබෝධි රජතුමා | D- ඉන්දියාවේ චේර රාජ්‍ය සමග සබඳතා පැවැත්වීම |

1) A, C, B, D 2) D, C, A, B 3) C, D, B, A 4) D, C, B, A

19)අතීත රජවරු ඉන්දියාව සමග විවාහ සම්බන්ධතා පවත්වා ගැනීමේ ප්‍රධාන අරමුණ වූයේ
1) විදේශ වෙළඳාමෙන් වඩා ආදායම් ලබා ගැනීමට
2) දේශපාලන බලය ස්ථාවරව පවත්වා ගැනීමට
3) විදේශ භික්ෂූන් මෙරටට ගෙන්වා ගැනීමට
4) බෞද්ධාගමික සබඳතා වර්ධනය කර ගැනීමට

20)විවිධ අවස්ථාවලදී සිදුකළ පැරණි දීමනා සඳහන් සෙල්ලිපිවල රාජකීයත්වය හැඟවීම සඳහා භාවිතා කළ සංකේතය කුමක්ද?
1) වටාපත 2) හංසයා 3) බල්ලා 4) අඩසඳ

21)සෙල්ලිපිවල නරේශ්වර යන නමින් තමන්ව හඳුන්වාගෙන ඇති රජු මින් කවරෙක්ද?
1) I වන කාශ්‍යප 2) කුටකණ්ණ අභය
3) දුටුගැමුණු 4) මහසෙන්

22)වසභ රජුට පසුව වංකනාසිකතිස්ස රජුට රාජ්‍ය උරුමය හිමිවූයේ
1) මව් උරුමයෙනි 2) පිය උරුමයෙනි
3) නායක්කර් සම්ප්‍රදායෙනි 4) රාජ්‍ය පැහැර ගැනීමෙනි

23)මුතුගල්ල නම් ස්ථානයෙන් හමු වූ සෙල්ලිපියකට අනුව මජ්ජිම යනුවෙන් හැඳින්වූයේ කුමන වෘත්තිකයෙක්ද?
1) කම්මල්කරුවෙකි 2) ගොවියෙකි
3) වෙළෙන්දෙකි 4) ධීවරයෙකි

24)පොළොන්නරුව පාලන මධ්‍යස්ථායක් ලෙස තෝරා ගැනීමට බලපෑ ප්‍රබලම සාධකය මින් කුමක්ද?
1) ගෝකණ්ණතිත්ථ වරායේ වෙළඳ කටයුතු පාලනයට පහසුවීම
2) මහවැලි ගඟ අසබඩ පිහිටා තිබීම නිසා පැවති ආරක්ෂාව
3) අනුරාධපුර රාජධානියට නිරන්තර දකුණු ඉන්දීය ආක්‍රමණ එල්ලවීම නිසා
4) පොළොන්නරුවේ සිට ලංකාවේ සියලු ප්‍රදේශ පාලනය පහසුවීම නිසා

25)මෙරට අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ නීති රීති ඇතුළත් මූලාශ්‍රයක් වන්නේ
1) සොරබොරවැව ටැම් ලිපිය 2) ගල්පොත ශිලා ලිපිය
3) මිහින්තලා පුවරු ලිපිය 4) තෝනිගල සෙල්ලිපිය

26)

- පනාකඩුව තඹ සන්නස
- වල්ලිපුරම් රන්පත් ලේඛනය

ඉහත මූලාශ්‍ර වලට අදාළ රජවරු දෙදෙනා පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

1) වසභ, I වන විජයබාහු
2) කුටකණ්ණ අභය, වසභ
3) වසභ, IV වන උදය
4) I වන විජයබාහු, වසභ

27)අනුරාධපුර යුගයේ සරු ආදයමක් ඉපැයූ අන්තර්ජාතික වරාය මින් කුමක්ද?

1) මාතොට
2) ගෝකණ්ණ
3) දඹකොළපටුන
4) ගොඩවාය

28)රජරට ශිෂ්ටාචාර සමයට අයත් කලාත්මක වටදගෙය පිහිටා ඇත්තේ

1) මැදිරිගිරිය
2) පොළොන්නරුව
3) අනුරාධපුරය
4) කුරුණෑගල

29)පහත සඳහන් A තීරුව B තීරුව සමඟ නිවැරදිව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ කුමක්ද?

| A | B |
|---|---|
| 1. යකඩ වැඩ කරන්නන් | A- තුලාධාර |
| 2. තඹ ලෝහ වැඩ කරන්නන් | B- කුඹකර |
| 3. රන් කර්මාන්තකරුවන් | C- දටික |
| 4. මැටි වලින් වැඩ කරන්නන් | D- කබර |
| | E- තබකර |

1) D E A B
2) D C A B
3) B C A E
4) C D E B

30)ජලයේ පීඩනය පාලනය කරමින් වැවේ ජලය පිටතට ගැනීම සඳහා තනන ලද ඇයත චතුරස්‍රාකාර අවකාශය හඳුන්වන නම කුමක්ද?

1) සොරොව්ව
2) බිසෝ කොටුව
3) රළපනාව
4) මොහොල

31)යකඩ නිස්සාරණයේ දී උඳුන් දැල්වීම සඳහා දැව අඟුරු සකසා ගැනීමට බහුලව භාවිතා කළ ශාක වර්ගය මින් කුමක්ද?

1) මරං
2) බෙලි
3) පොල්
4) කුඹුක්

32)හින්දු බැතිමතුන්ගේ පූජනීය ස්ථානයක් වන තිරුකේතීශ්වරම් හින්දු කෝවිල පිහිටි ප්‍රදේශය අතීතයේ හඳුන්වා ඇත්තේ

1) ගෝකණ්ණතිත්ථ නමිනි
2) මාතොට නමිනි
3) නකදිව නමිනි
4) ලංකාපට්ඨන නමිනි

33)දම්පියා අටුවා ගැටපදයේ "මධුපාචිකා" යන විශේෂ ගෞරව නාමයෙන් හැඳින්වූයේ කවුද?

1) සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන්ය
2) සංගීතයේ දක්ෂ කාන්තාවන්ය
3) මිහිරි වචන කතා කරන කාන්තාවන්ය
4) සාලිය කුමරුගේ බිසව අශෝකමාලා

34)උළු කැද නමින් හැඳින්වූ කැඳ වර්ගයක් පිළිබඳ සඳහන් වී ඇති පැරණි සාහිත්‍යය කෘතිය මින් කුමක්ද?

1) සද්ධර්මාලංකාරය
2) රසවාහිනිය
3) පූජාවලිය
4) සද්ධර්මරත්නාවලිය

35) ආර්ථික හැකියා පදනම් කරගෙන නිර්මාණය වූ සමාජ ස්ථරායන ක්‍රියාවලියේ වැදගත්ම ප්‍රතිඵලය වූයේ කුමක්ද?

1) නගර බිහිවීමට පදනම වැටීමයි
2) කෘෂි කර්මාන්තය දියුණු වීමයි
3) ජනයා විවිධ ප්‍රදේශවලට සංක්‍රමණය වීමයි
4) නිෂ්පාදන අතිරික්තය ඇතිවීමයි

36) නගර නිර්මාණය ජ්‍යාමිතික ආකෘතියෙන් මිදී නිදහස් ස්වරූපයට පරිවර්තනය වීමේ ලක්ෂණයට අදළ නගර වන්නේ

1) අනුරාධපුරය, මාගම
2) පොළොන්නරුව, කුරුණෑගල
3) අනුරාධපුරය, පොළොන්නරුව
4) දඹදෙණිය, යාපහුව

37) ආරක්ෂාව, කලාත්මක බව හා ජල තාක්ෂණය භාවිතය අතින් විශිෂ්ටතම නිර්මාණයක් ලෙස අගය කළ හැකි නිර්මාණයක් වන්නේ

1) කුට්ටම් පොකුණ
2) වටදාගෙය
3) සීගිරිය
4) නෙළුම් පොකුණ

38)

- බෙලිගල දළඳා මැදුරක් ඉදිකිරීම.
- කාලිංඝ මාඝ පරාජය කිරීම.

ඉහත සඳහන් කාර්යයන් දෙක ඉටුකළ රජවරු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1) දෙවන පරාක්‍රමබාහු, හතරවන බුවනෙකබාහු
2) තුන්වන විජයබාහු, දෙවන පරාක්‍රමබාහු
3) තුන්වන විජයබාහු, පළමුවන බුවනෙකබාහු
4) හයවන පරාක්‍රමබාහු, IV වන බුවනෙකබාහු

39) භෞතික විද්‍යාත්මක මූලධර්ම පිළිබඳ හසල දැනුමක් පැරණි ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් සතුව පැවති බව සනාථ වන නිර්මාණයක් වන්නේ මින් කුමක්ද?

1) පැරණි ශල්‍ය වෛද්‍ය උපකරණ
2) කුට්ටම් පොකුණ
3) දැදිගම ඇත්පහන
4) මාදුරු ඔය ජලාශයේ පැරණි සොරොව්ව

40)

- පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.
- දළඳා සිරිත හා දළඳා පූජාවලිය රචනා කිරීම.

ඉහත සඳහන් සිදුවීම් කවර රාජ්‍ය සමයට අයත් ද?

1) දඹදෙණිය
2) කුරුණෑගල
3) ගම්පොළ
4) කෝට්ටේ